රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :10/2004(I)

මගේ අංකය:PA/CS/6/5/අමා.මණ්.සංදේශ(රා.ක.ස.සේ.)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2010.07.06

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණට අදාල මගේ අංක PA/CS/MAS/2 හා 2004.12.30 දිනැතිව නිකුත් කරන ලද අංක 10/2004 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පහත පරිදි සංශෝධනය කරමි.

02. 2004.01.01 දින සිට 2004.12.23 දින දක්වා විශ්‍රාම යාම හේතුවෙන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට අවස්ථාව නොලැබූ නිලධාරීන් කල්පිත පදනම මත 2004.01.01 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීම 2010.05.26 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමත කොට ඇත.

03. ඒ අනුව හිඟ වැටුප් ගෙවීමකින් තොරව (2004.01.01 දින සිට 2004.12.23 දක්වා කාලය තුල විශ්‍රාම ගැන්වූ) උක්ත නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් නව වැටුප් පරිමාණයට අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් සංශෝධනය කළ යුතුය. එහෙයින් උක්ත කාලය තුල විශ්‍රාම ගන්වන ලද නිලධාරීන්ගේ නව වැටුප් විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීමට ක්‍රියා කල යුතුය.

04. අංක 10/2004 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය නොවී විශ්‍රාම ගැනීමට මනාපය පළ කර, විශ්‍රාම ගොස් ඇති නිලධරයන්ට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ.

05. එම චක්‍රලේඛයේ අනෙකුත් විධිවිධානවල කිසිදු වෙනසක් සිදු නොවේ.

ඩී.දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.